# චන්ද්‍රාලෝකය

(පායාසී රාජඤ්ඤ සූත්‍රය)



සම්පාදනය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

ධර්ම දානය

පූජ්‍ය වැල්ලවත්තේ ධම්මදීප ස්වාමීන් වහන්සේ සහ
ඥාති පිරිස විසිනි.

# සුභාසිංශනය

## විශේෂ අරමුණ :

2008. 12. 18 වැනි දිනට සුභ උපන් දින සමරණ ත්‍රිපිටක විශාරද අතිපූජනීය කහගොල්ලේ සෝමවංස ස්වාමීන් වහන්සේට නිරෝගි සුව දිගාසිරි ප්‍රාර්ථනා කරමි.

## සම්පාදනය :

මෙම මනහර ධර්ම ග්‍රන්ථය සම්පාදනය කළ පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට තව තවත් දහම් ග්‍රන්ථ සම්පාදනය කරමින් බෝධිකාරක ධර්ම සපුරා ප්‍රාර්ථනා පරිදි නිවන් සුව ලැබේවා.

## ධර්මදානය :

ධර්ම දානය සඳහා උපකාර වූ පූජ්‍ය වැල්ලවත්තේ ධම්මදීප ස්වාමීන් වහන්සේ ප්‍රධාන ඥාති පිරිසට මේ උතුම් කුසලයම සැප පිණිස වේවා

## වෙනත් අරමුණු :

අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාද රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුව පිනවංසාභිධාන ස්වාමීන් වහන්සේට මතු ලොව්තුරා බුදුබව ප්‍රාර්ථනා කරමි. වත්මන් යෝගාශ්‍රමාධිපති මහා කම්මට්ඨානාචාර්ය පූජනීය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නයට නිරෝගි සුව දිගාසිරි කෙළවර නිර්වාණ සුවය ප්‍රාර්ථනා කරමි.

සියලු සත්වයෝ දුකින් මිදෙත්වා !

මෙයට
මෙතැති,
**ලග්ගල කල්‍යාණවංස හිමි.**

ගල්දූව ආරණ්‍ය සේනාසනය
කහව - අම්බලන්ගොඩ.
2008. 11. 20 දින

# චන්ද්‍රාලෝකය

## (පායාසි රාජඤ්ඤ සූත්‍රය)

<u>සම්පාදනය</u>

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

<u>ධර්ම දානය</u>

පූජ්‍ය වැල්ලවත්තේ ධම්මදීප ස්වාමීන් වහන්සේ සහ ඥාති පිරිස විසිනි.

$\frac{2552}{2008}$ දෙසැ. 18



ත්‍රිපිටකාචාර්ය

කහගොල්ලේ සෝමවංස ස්වාමීන් වහන්සේ

# පුණ්‍යානුමෝදනාව

පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසින් සකස් කරන ලද මෙම දහම් පොත පායාසි රාජඤ්ඤ සූත්‍රය අලලා සකස් කරන ලද්දකි. මේ කියවන පාඨක ඔබට ඒ පිළිබඳව වැටහීමක් ලැබෙනවා ඇත. ධර්මය කවර සූත්‍රයකින් බැලුවත් භාවනා මාර්ගයකි. නිවනට පමුණුවන දේශනාවකි. ලොව්තුරා සුවය පතමින් ගුණධර්ම දියුණු කරන සාධූන් හට ඒ තත්වය ලබාගත හැකිය.

ධර්ම දානමය පින අනර්ඝය. නිවන දක්වාම සැපවත් ජීවිතයක් ලැබීමට මහෝපකාරීවේ. මහා බුද්ධිමත් ජීවිතයක් ලැබෙති. සංස්කාරක ස්වාමීන් වහන්සේට තෙරුවන් සරණින් යහපතක්ම වේවායි ආශිර්වාද කරමි. මුද්‍රණ වියදම දැරූ පූජ්‍ය වැල්ලවත්තේ ධම්මදීප ස්වාමීන් වහන්සේට සහ පවුලේ ඤාතීන්ට ධර්ම දානමය කුසල බලයෙන් නිදුක් නිරෝගී සුව දිගාසිරි ලැබේවා ! සියලු පැතුම් සඵල වේවායි මෙත් සිතින් ආශිර්වාද කරමි.

මෙයට,
කාරුණික,

**කහගොල්ලේ සෝමවංස හිමි**

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දූව - කහව.
2008. 10. 13

ගල්දූව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ලේඛකාධිකාරී අතිපූජ්‍ය ත්‍රිපිටකාචාර්ය කහගොල්ලේ සෝමවංශ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ 43 වෙනි ජන්ම දිනය වර්ෂ 2008. 12. 18 නිමිත්තෙන්

තරුණ වියේ සිටින නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට බුදුරජාණන් වහන්සේගේ උතුම් ධර්මය ලෝකවාසී ජනතාව අතට පත්කිරීමට අවශ්‍ය සියලුම ශක්තිය ධෛර්යය ලැබේවා, නිරෝගී සුවය ලැබේවා ! දීර්ඝායුෂ ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු. ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ දෙමව්පිය ඇතුළු සියළු ලෝකවාසීන්ට නිර්වාණය අවබෝධය පිණිසම හේතුවේවා !

මෙම ධර්ම ග්‍රන්ථය කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් දේශනා කරන ලද "පායාසි රාජඤ්ඤ සූත්‍රය" ඇසුරෙන් සකස් කළ පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට නිරෝගී සුවය, දීඝායුෂ ප්‍රාර්ථනා කරන්නෙමු.

මෙම ආරණ්‍ය සේනාසනයේ ආරම්භක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු ආරම්භයේ සිට වැඩ වසා අපවත් වී වදාළ සියලුම ස්වාමීන් වහන්සේලාටත්, ආරම්භයේ සිට දායකත්වය දරා දැනට මිය පරලොව ගොස් සිටින දායක දායිකාවන්ට ද නිවන් සුව පිණිසම වේවා !

ධම්මදීප හිමිගේ මියගිය දෙමව්පියන් ඇතුළු මියගිය සියළුම ඥාති හිතවතුන්ට නිවන් සුව පිණිසම වේවා ! එම හිමිගේ ශාසනික ජීවිතයට අත හිත දුන් සියළුම ස්වාමීන් වහන්සේලාටත් දායක දායිකාවන්ටත්, ඥාති හිතවතුන්ටත් ආශිර්වාදයක් වේවා !

මෙයට,
කාරුණික,

**වැල්ලවත්තේ ධම්මදීප හිමි**

ගල්දූව ආරණ්‍ය සේනාසනය
ගල්දූව - කහව.

# මේ ගැන වචනයක් ...

**"එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං චිත්ත කථිකානං යදිදං කුමාරකස්සපෝ" මේ ගෞතම සම්බුද්ධ සාසනයෙහි (චිත්‍ර කථික) විචිත්‍ර ධර්ම කථික භික්ෂූන් අතර මේ කුමාර කාශ්‍යප ස්ථවිරයන් අග්‍රය ය.** යනු බුද්ධ දේශනා ය.

(අං.නි.ඒ.පා.)

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ වනාහි විචිත්‍ර ධර්ම කථික භික්ෂූන් අතර අග්‍ර වූහ. උන්වහන්සේ එක් කෙනෙකුට හෝ දෙදෙනෙකුට දහම් දෙසන කල්හි ද බොහෝ උපමා ආදිය කියා අවබෝධ කරවමින් ම දහම් දෙසන්නාහ. එහෙයින් මෙම අග්‍රස්ථානය උන් වහන්සේ මේ බුදු සසුන්හි ලත්සේක. මෙය පෙර පියුමතුරා (පදුමුත්තර) බුදු සසුන්හි දී ඇතිකරගත් උතුම් පැතුමකි.

පන්සියයක් භික්ෂු සංඝයා පිරිවරාගත් කුමාර කාශ්‍යප තෙරණුවෝ කොසොල් රට සේතව්‍යා නුවර සිංසපා වනයෙහි වැඩවසන දවසක පායාසිරාජන්‍ය (අබිසෙස් නොලත් රජ) තෙමේ උන්වහන්සේ වෙත ගොස් (මහ පිරිස් සමගින්) කර්මය සහ පුනර්භවය පිළිබඳ අසන ලද ප්‍රශ්නයකට ඉතාමත් විසිතුරු ලෙස ප්‍රශ්න පසළොසකින් සරසා සූත්‍රාන්තයන් දෙසූ කල්හි ඒ සූත්‍රාන්තය (ධර්ම දේශනය) අර්ථෝත්පත්ති කොට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂු සංඝයා මැද ඉහත සඳහන් පරිදි "මේ ශාසනයෙහි විචිත්‍ර ධර්ම කථික භික්ෂූන් අතර මේ කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේ අග්‍රස්ථානයෙහි තබා වදාළ සේක.

මෙම වෘත්තාන්තය පාදක කොට කර්මය සහ පුනර්භවය පිළිබඳ විවරණයක් පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසින් සපයා ඇත. පූජ්‍ය වැල්ලවත්තේ ධම්මදීප ස්වාමීන් වහන්සේ ඉමහත් ශ්‍රද්ධාවෙන් දායකත්වය දරමින් මෙම දහම් පොත මුද්‍රණය කොට බොදුනුවන් අතර බෙදා දීම අතිශයින් ප්‍රශංසනීය ය. සියලු දානයන් පරදවා ධර්ම දානයම ජය ගන්නා බැවිනි. විශේෂ ධර්ම ප්‍රාර්ථනා ඇතිකර ගනිමින් මෙහි මුද්‍රණ දායකත්වය දරණ පූජ්‍ය වැල්ලවත්තේ ධම්මදීප ස්වාමීන් වහන්සේට මේ ප්‍රණීත කුසල් බලයෙන් පවතින අපල උවදුරු ලෙඩ දුක් දුරුවේවා. අකුසල විපාක දුක් අඳුරු වේ නම් ඒ සියල්ල ද දුරින් ම දුරුවේවා. කුසල විපාක ආලෝකය පහළ වේවා.

කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේට මෙන් ඤාණවන්ත, තේජවන්ත, ගුණවන්ත, පිංවන්ත ජීවිත ලබමින් මධුර මනෝහර ලෙස විචිත්‍රවත්ව ධර්ම දේශනා කිරීමේ ශක්තිය ලැබේවා. වාග් කුසලතාවයෙන් ජනප්‍රිය වේවා. නිර්වාණගාමිණී කුසල් සපිරීමෙන් පැතුම් පරිදි ශාන්ත නිවන් සුවයද සාක්‍ෂාත් වේවා. සම්පාදක පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට ද මේ කුසල් බලයෙන් නිදුක් නිරෝගී සුව දිගාසිරි අත්වේවා. තව තවත් මෙවන් ශාසනික සත්කාරයන් සිදු කිරීමට ශක්තිය බලය මෙන්ම ධර්මඥාණය ද මුදුන්පත් වේවා. සුවසේම ධර්මාවබෝධය සිද්ධ වේවා.

සතළිස් තෙවෙනි ජන්මදිනය සමරණ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ අතිරේක ලේඛකාධිකාරී අතිපූජ්‍ය ත්‍රිපිටක විශාරද කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේට ද මෙම ධර්මදාන කුසලය පිහිටීමෙන් හා ශ්‍රීමත් බුද්ධාදි රත්නත්‍රයේ අනන්ත ගුණ බලයෙන් නිදුක් නිරෝගී සුව දිගාසිරි අත්වේවා. ස්වකීය විවේකය පවා පසෙකලා අපරිමිත ධෛර්යයෙන් සිදුකරනු ලබන ආගමික - ජාතික මෙහෙවර ඉදිරියටත් සුවසේ පවත්වාගෙන යාමේ ශක්තිය බලය තව තවත් ලැබේවා. එසේම සසුනඹර එකළු කරන සුපුන් සඳක් බඳු ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක අතිගෞරවණීය ත්‍රිපිටකධාරී - ආචාර්ය මහාකම්මට්ඨානාචාර්ය නාඋයනේ ශ්‍රී අරියධම්මාභිධාන මහා ස්වාමිපාදෝත්තමයන් වහන්සේට ද මෙපින් බෙලෙන් හා තුනුරුවනේ ආශිර්වාද බලයෙන් නිදුක් නිරෝගී සුව දිගාසිරි අත්වේවා. ශාසන දයාවෙන්ම සිදුකරනු ලබන සසුන් මෙහෙවර තව තවත් ඉදිරියට පවත්වාගෙන යාමේ ශක්තිය බලය උදාපත්වේවා. සෙසු මහ සඟරුවනටත් උපකාරක - අනුපකාරක, ජීව - අජීව සැමටත් සැප ප්‍රතිපදාවෙන් ඒ අමානිවන් සුවසේ සාක්‍ෂාත් වේවා !

මෙයට,

ශාසනස්ථිතිකාමී

**නාඋයනේ අග්ගවංස භික්ඛු**

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දූව - කහව.
2008. 11. 06

ශ්‍රී බුද්ධ වර්ෂ 2550 ක් වූ වේශාත මස කාලපක්‍ෂයෙ නවවන බ්‍රහස්පතින්දා දිනය

රාජ්‍ය වර්ෂය - 2008. 04. 29

නමෝ තස්ස භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස !

තුන්ලෝකාග්‍රවූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගෙන් අපට ලැබුණාවූ මහා නිධානයක්වූ ධර්මස්කන්ධයෙන් බිඳක්වූ **"පායාසි"** සූත්‍ර දේශනාව ඇසුරෙන් සම්පාදනය කරන ලද ධර්ම දානයක්වූ ග්‍රන්තයකි.

තවද එක් සමයෙක්හි කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ 500 ක් මහණ පිරිවර සහිතව කොසොල් ජනපදයෙහි සැරිසරනුයේ කොසොල් රැටියන්ගෙ "සේතව්‍යා" නුවරට සමීප (ඇටිටේරිය වනය) සිංසප වනයේ වැඩ වාසය කළ සේක.

එසමයෙහි රාජ්‍ය අභිෂේක නොලත් පායාසි නම් නායකයෙක්, කොසොල් රජතුමාට අයත් මෙම සම්පත් පිරි නගරයෙහි පාලනය කරත්. එසේ සිටින අතර මෙතුමාට මෙවැනි අදහසක් පහළ විය. මරණින් පසු උපදනා කෙනෙක් නැත. ජිවත්ව සිටියදී කරන, කියන දෙයට විපාක නැත. පව පින කියා දෙයක් නැතැයි මෙබඳුවූ ලාමක සිතක් ඇතිවිය.

මේ අතර එම ප්‍රදේශ වැසියන්ට බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ 500 මහණ පිරිසක් සමග මෙම ප්‍රදේශයේ වැඩ වාසය කරන බවත් උන් වහන්සේලා බොහෝ සෙයින් සංවර බවත්, සිල්වත් බවත් මහත් නුවණ ඇති කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ දැක්ම බොහෝ සෙයින් ප්‍රයෝජනවත් වන බවත් විසිතුරු කථා ඇති මෙම මහ සඟ පිරිස වන්දනා මාන කිරීම උතුම් ක්‍රියාවක් බව සිතා

මෙසේ ගුණ වර්ණනා කර මහ පිරිස එක්රැස්ව පෙරහැරක් ගමන් කරන ආකාරයට සිංසපා වනය දෙසට ගමන් කරන්නාහු මහ

★ *රාජන්‍යය යනු රජතුමා වශයෙන් පිළිගන්න.*

සෙනඟ පායාසි රාජන්‍ය තෙම සිය පායාසයෙහි උඩුමහල් තලයෙහි සිට දැක තම සේවකයෙකුගෙන් ඒ ගැන විමසීය. එවිට එම සේවකයා සියළු පුවත් එළිකර සිටියේය.

ඉන් පසු පායාසි රාජන්‍යයද, කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ හමුවීමට යන බව දන්වා එම පිරිසට එතුමා පැමිණෙන තුරු මඳක් නවතින ලෙස දන්වා යැවීය. ඉන් පසු එතුමාද, නුවර වැසි පිරිසද, එතුමාගෙ පිරිසද, එකතුව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස වැඩසිටි ඇටිටේරිය වනයේ වැඩසිටි ස්ථානයට ගොස් කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සෙ වැඳ නමස්කාර කර සතුටු සාමීචි කතා කර එකත් පසෙක හිඳ ගත්හ.

එක් පසෙක හුන් පායාසි රාජන්‍ය තෙම මහ තෙරුන් වහන්සේ සමග මෙසෙ කතාව ආරම්භ කළේය. භවත් කාශ්‍යපයන් වහන්ස මාගෙ පිළිගැනීම නම් පරලොවක් නැත. පුනර්භවයක් නැත. කුසල් අකුසල් විපාක දීමක් නැ. යනු මගෙ පිළිගැනීමයි.

එවිට මහ තෙරුන් වහන්සේ "රාජන්‍යයෙනි, මෙබඳු වාද ඇති, මෙබඳු දෘෂ්ටි ඇති කෙනෙකු මම මීට පෙර දැක නැත. අසත් නැත. .මෙසෙත් පරලොවක් නැතැයි උපපාදුක සත්වයො නැතැයි කුසල් අකුසල් කර්මයන්ගෙ ඵල විපාක නැතැයි කියන්නෙ මොන කරුණක් උඩද, එසේ නම් රාජන්‍යයෙහි මෙහි ඔබව පිළිවිසීම්. යම්සෙ ඔබට රිසියෙ නේද, එසේ එය විසඳන්න. රාජන්‍යයෙනි, ඒ කුමක් කියා සිතනවාද? ඉර සඳ, දෙදෙනා මෙලොවට පරලොවට අයිති එම දෙදෙනා දෙවියන්ද? මනුෂ්‍යයින් ද?

**පායාසි :**

කාශ්‍යපයන් වහන්ස, මෙම හිරු දෙවියොත් සඳ, දෙවියොත් පරලොව වෙති. මිනිසත් ලොවහි නොවෙති. එම දෙදෙනා දෙවියෝ වෙති.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

"රාජන්‍යයෙනි, ඔබගෙ මෙම පිළිගැනීමෙන් පරලොවක් ඇත. උපපාදුක සත්වයො ඇත. කුසල් අකුසල්වල විපාක ඇතැයි ඔබට මෙබඳු සිතක් වේවා.

පායාසි :

"භවත් කාශ්‍යපයන් වහන්සෙ, මෙසේ වදාරතත් මට මෙහි මෙසේ පරලොවක් නැත. උපපාදුක සත්වයො නැත. කුසලා කුසල කර්මයන්ගෙ ඵල විපාක නැතැයි මෙබඳු සිතක් වෙයි.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

රාජන්‍යයෙනි, පරලොවක් නැත. උපපාදුක සත්වයො නැත. කුසලා කුසල කර්ම විපාක නැතැයි කියා ඔබ සිතන්නෙ කිනම් හේතුවක් නිසාද

පායාසි :

කාශ්‍යපයන් වහන්ස, මෙහි මාගේ බොහෝ විශ්වාස හිතවන්තයෝද, සහලේ නෑයොද, හිතවත් කිකරු සේවකයෝද, සෑම සියළු ආකාරයෙන් පස්පවු දසඅකුසල් කරන්නෝද වෙති. මිත්‍යාදෘෂ්ටි ගත්තෝද, ඔවුන් ක්‍රමයෙන් ලෙඩ රෝගවලට ගොදුරුව දැඩි ගිලන් බවට පත්වූ බව දැන ගැනිමට ලැබුණු විගස ඔවුන් වෙත ගොස් ඇතැම් මහණ බමුණන් කියන මෙලොව වැරදි කරන වුන්ට දුකින් පිරුණු සැපෙන් තොර නිරයට පමුණුවන්නාහයි කියති. එහි සත්‍ය අසත්‍ය දැන ගැනිමට මට අවශ්‍ය නිසා තොපි ඔය කියන දුක්ඛිත පීඩා දෙන නිරයකට පත්වුනොත් මාහට වහාම දැනුම් දෙන්නයි එසේත් නැත්නම් එහි සත්‍ය අසත්‍යතාවයක් එහි විස්තරත් වෙනත් කෙනෙකු මාර්ගයෙන් හෝ වහාම දන්වා එවන්නැයි කියා ඔවුන් මැරෙන්ට ප්‍රථම පොරොන්දු කරවා ගනිමි.

නමුත් එසේ පොරොන්දුවී මැරුණු සොරකම් කිරීමෙන් කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන්ද, කේලාම් කීමෙන්ද, පරුෂ වචන කීමෙන්ද, වාචාල හිස් වචන කීමෙන්ද, අනුන්ගෙ සම්පත් වලට දැඩි ලෝභ සිත් ඇති කරගත්තෝද, ක්‍රෝධයෙන් පළිගන්නවුන්ද, මිත්‍යාදෘෂ්ටි ගත්තෝද, මාහට එහි තොරතුරු දැන්වීමට පොරොන්දුවී මැරුණත් මේ දක්වා එකද පුද්ගලයෙකු හෝ වෙනත් පණිවිඩකරුවෙකු හෝ මා වෙත කිසි තොරතුරක් සැපයුවේ නැත. මැරෙන්ට ප්‍රථම ඔවුන් සෑම කෙනෙක්ම මැරුණෝ එහෙම තැනක් තිබෙනවා නම් දන්වා එවන බවට පොරොන්දු වීය. එසේ නොමැති නිසා මම මෙම මතය පිළිගනිමි.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එසේ නම් රාජන්‍යයෙනි, ඔබගෙ රාජ්‍යය ඇතුළත ඔබගෙ අන පිළිනොපැද, වරදක් කරන්නෙක් රාජ පුරුෂයන් විසින් අල්ලා ඔබ ඉදිරියට පමුණුවා මොහු මෙවැනි වරදක් කළ සොරෙකියි කී කළ ඔබ ඔහුට මෙසේ දඬුවම් කරවයි නියෝග කළ විට එම රාජ පුරුෂයො ඔහු වදකාගාරය වෙත ගෙන යාම්දි එම අපරාධකරු විසින් රාජපුරුෂයින්ට මෙසේ කියය. අනේ පිංවතුනි මාගෙ අසවල් ගමෙ සිටින මාගෙ නෑයින්ට දන්වා මා සතු වස්තු ඔවුන්ට පවරා එනතෙක් මට සමාව දෙන්නැයි ඉල්ලූ විට එසෙ දෙයිද? නොඑසෙ නම් දඬුවම පමුණුවත්ද

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, එම වරදකරු කොපමණ අඬ අඬා වැළපුනත් ඔහුට කිසිම පිහිටක් ලැබෙන්නෙ නැත. ඔහු හඬා වැළපෙද්දිම දඬුවම පමුණුවයි.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

රාජන්‍යයෙහි වරදකරුවාත් මනුෂයයෙකුම වී දඬුවම් පමුණුවන්නාත් මනුෂයයෙකුම වී එම දඬුවම පමුණුවන පුද්ගලයාටත් එවැනිම තත්වයක් වුවොත් වරදකරුගෙ ඉල්ලීමවත් තත්වයට පත්වන බව දැන දැනත් අවසරයක් නොදෙන්නෙම්.

ඔබගෙ රාජ්‍යයෙහි සොරකම් කරන, ප්‍රාණඝාත අකුසල් කරන, කාමයෙහි වරදවා හැසිරෙන, බොරු කේලාම්, පරුෂ වචන, හිස් වචන, කියන අන්සතු දෙයට දැඩි ලෝභ කරන ක්‍රෝධය, මාන්නය මිසදිටු අදහස් ගත් අය ඔබට මොන හිතවත්කම් තිබුණත් පොරොන්දු වුවත් මරණින් පසු සැපෙන් තොර දැඩි දුකින් පිරුණු නිරයට වැටුණු පසු දරුණු යම පල්ලෙකුගෙන් අපගෙ රජතුමාට මෙවන් පොරොන්දුවක් වුනෙම්. පරලොවක් ඇත. කරන ක්‍රියාවලට අනුව දඬුවම් ලැබෙනු ඇත. එක් එක් කර්ම බලවේගයන්ගෙන් උපන් සත්වයින් ඇතැයි කියා ආපසු එනතෙක් ඉවසත්වායි කියා ඉල්ලීමේදි යමපල්ලන්ගෙන් ඉඩක් ලැබේද? එම නිසා රාජන්‍යයෙනි මෙම කරුණු කාරනා අනුව පුනර්භවයක්

ඇතැයි කරන ක්‍රියාවත් අනුවත් කියන වචන අනුවත් කර්ම විපාක ඇතැයි කියා සිතක් ඔබට පහළවේවා.

**පායාසි :**

ඔබ වහන්සේ මෙසේ වදාරතත් මට එය පිළිගැනීමට අපහසුය.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි, කවර හේතුවක් නිසා පිළිගැනීමට නොහැකිද?

**පායාසි :**

භවත් කාශ්‍යපයෙනි, මා විසින් කලින් සිහිපත්කර සිටියෙ අකුසල් කර නිරයගාමී වූ අය ගැනයි. මෙතනදී මතක් කර සිටින්නෙ සිතෙන්, කයෙන්. වචනයෙන් කිසිම වරදක් නැති එම තුන්දොරම සන්වරව පවත්වාගෙන යන අතරම එම තිදොරින්ම දස පුණ්‍ය ක්‍රියාවන්හි යෙදී ජීවත්ව මරණාසන්නයේදී මා විසින් පෙර සඳහන් අයට කී පරිද්දෙන් මාහට දැන ගැනීමට අවශ්‍ය පරලොවක් තිබේද, කුසල් අකුසල් විපාක තිබේද, මරණින් මතු උපදින ආත්මයක් තිබේද යනු දැන ගැනීමට බලවත් උවමනාවක් තිබෙන නිසා ඔබ බොහෝ කුසල් කරගත් කෙනෙකි. එම නිසා මරණින් පසු යම්කිසි ආත්මභාවයක් ලබන්නේ නම් හෝ එහි විස්තර අප්‍රමාදව මාහට දන්වන්නැයි ඉල්ලා සිටියෙමි. ඔබගෙ පිළිතුර මම පිළිගනිමි. අප්‍රමාදව මා වෙත එම තොරතුරු දන්වන්නැයි ඉල්ලා සිටියත් එකම කෙනෙකුගෙන්වත් කිසිම පිළිතුරක් නැති නිසා මම එම මතයෙ සිටිමි.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි, මම ඔබට එක් උපමා කථාවක් කියන්නම්. බොහෝ නුවණැති පුද්ගලයෝ උපමා කථාවලින් බොහෝ කරුණු කාරණා තේරුම් ගනිති. එක්තරා මනුෂ්‍යයෙක් දූහද හමන අසූචි වලකට වැටී ගොඩ ඒමට නොහැකිව දඟලනු ඔබ දුටුවොත් සේවකයින්ට අණකර එම තැනැත්තා අසූචි වලෙන් ගොඩගෙන ඔබගෙ නියමය පරිදි ඔහුගෙ ඇඟේ තිබෙන අසූචි කොටස් ඉවත් කර වතුර නාවා පිරිසිදු කර

තවදුරටත් ඇඟෙ සුවඳ විලවුන් ගල්වා පිරිසිදු ඇඳුම්, පැලඳුම් වලින් සරසා ඉතා මිහිරි ආහාර පාන ආදි සැප සම්පත් ලැබේ නම් එම පුද්ගලයා නැවත අර අසුචි වල දිසාවට යයිද?

**පායාසි :**

හවත් කාශ්‍යපයන් වහන්ස, එසේ නොවේම ය.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

ඒ කුමක් නිසාද?

**පායාසි :**

ස්වාමීනි, අසුචි වල අප්‍රසන්න දුගඳ හමන්නේය. අසුචි වලින්ම පිරී පිරී පවති. පණුවන්ගෙන් තව තවත් පිළිකුලම උපදවයි.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි, එසේම මිනිසුන් දෙවියන්ට අපිරිසිදුය. අසුචි නිපදවන යන්ත්‍රයකි. දුගඳය. ශරීරයේ සෑම කොටසකින්ම දුගඳම පිට කරයි. පිළිකුල්ය. රාජන්‍යයෙනි මිනිසුන්ගෙ ගඳ දෙවියන්ට යොදුන් සියයක් ඈතට දැනෙයි. තවද ඔබගෙ අමාත්‍යයෝ, සහලෙ නෑයෝ, අවංක සේවකයෝ, පුරවැසියො සොරකමින් වැළකුනාහ, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුනාහ. මුසාවාදයෙන් වැළකුනාහ. කේලාම්, පරුෂ බස්. හිස් වචන කථාවෙන් ඉච්චාබස් කථාවෙන් අන්සතු වස්තුවට ලෝභ නොසිතත්, ඊර්ෂ්‍යා සිත් නැත්තාහු. මිත්‍යාදෘෂ්ටි නැත්තාහු ප්‍රාණඝාත අකුසලයෙන් ද, අනුබලයෙන්ද වැළකුනාහු, දස පුණ්‍යක්‍රියාවන්හි හැසිරෙන්නාහු.

මෙම පිංවතුන් මරණින් පසු නිදා පිබිදියක් මෙන් කරගත් කුසල් අනුව එයට අයත් සුගති ආත්ම භාවයන් ලබති. එම සත්වයින් ආපසු පණිවිඩ දීම සඳහා පෙරකී අසුචිවල වන් මෙම ගූථ ලෝකයට පැමිණෙත්ද? මෙම කරුණු කාරණා අනුව ඔබගෙ සිත මිත්‍යාදෘෂ්ටියෙන් මිදේවා.

පායාසි :

මෙම කරුණුවලින්ද මාගේ පිළිගැනීම වෙනස් නොවේ.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එසේ නම් තවත් කරුණක් ඇත්නම් ඒ කුමක්දැයි කියව.

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, සතුන් මැරීමෙන් වැළකී, සොරකම් කිරීමෙන් වැළකී, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී, මුසාවාදයෙන් වැළකී, මත් කරවන ප්‍රමාදයට හේතුවන සුරාපානයෙන් වැළකී, මාගේ මහාමාත්‍ය කෙනෙක් සහලේ නෑ කෙනෙක් මෙන් වූහ. මෑත කාලයෙහි ඔහු ආබාධ ඇත්තාහු. දුකට පැමිණියාහු, දැඩි ගිලන් බවට පත්වූවාහුය. දැන් මොහු මෙම ආබාධයෙන් නොම නැගී සිටින්නාහයි යම් කලෙක දැන ගනිත්ද එකල ඔවුන් කරා එළඹ භවත්නි, යම් කෙනෙක් ප්‍රාණඝාතයෙන් වැළකුනාද, සොරකමින් වැළකුණාද, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණාද, මුසාවාදයෙන් වැළකුණාද, මත් කරවන ප්‍රමාදයට හේතු කරවන මත්පැන් පාණයෙන් වැළකුණාද ඔහු මරණින් මතු මනා ගති ඇති සුගතියට පැමිණෙත්. තව්තිසා දෙවියන් හා එක්වීමට පැමිණෙත්" යැයි මෙබඳු වාද ඇති, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. භවත්හු වූ කලී මෙම පාපකර්මයන්ගෙන් වැළකිය. ඉදින් ඒ භවත් මහණ - බමුණන් බස සැබෑවී නම් භවත්හු කාබුන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ග ලොවට පැමිණෙන්නාහ. තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට පැමිණෙන්නාහ. "භවත්නි, ඉදින් තෙපි කාබුන් මරණින් මනා ගති ඇති සඟ ලොවට පැමිණෙන්නාහු නම්, තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට පැමිණෙන්නාහු නම්,

එකල මා වෙත පැමින මෙසෙත් පරලොවක් ඇත. උපපාදුක සත්වයො ඇත. කුසලා කුසල කර්මයන්ගෙ ඵල විපාක ඇතැයි මාහට දන්වවු.. භවත්හු වනාහි මා විසින් ඇදහිය යුතු වචන ඇත්තාහුය. විශ්වාස කටයුතු වචන ඇත්තාහුය. යමක් භවතුන් විසින් දක්නා ලදද යම් සෙ මා තමා විසින්ම දක්වා ලද දෙයක් සේම වන්නේය. ඔහු මැනවැයි මට පිළිවන්දන් දි අවුත් නොම දන්වත්, දූතයකු නොම එවත්. භවත් කාශ්‍යපයන් වහන්ස, මෙසෙත් පරලොවක් නැත. මෙසේ

ඖපපාදුක සත්තු නැත. මෙසේ කුසලා කුසල කර්මයන්ට ඵල විපාක නැතැයි යම් කරුණකින් මෙබඳු සිතක්වේද මේද ඒ කරුණක්මය.

**කුමාරකාශ්‍යප හිමි :**

"රාජන්‍යයෙනි, ඔබගෙ සිතට එකඟව මෙම කරුණු විසඳන්න. රාජන්‍යයෙනි, මිනිස් වර්ෂ අවුරුදු 100ක් තව්තිසා දෙව්ලෝකයට එක්දිවා රාත්‍රියකි. (පැය 24) එවැනි දින 30 ක් (එම දෙවියන්ට) මාසයකි. එවන් මාස 12 ක් ඔවුන්ට එක් අවුරුද්දකි. එවැනි දිව්‍ය අවුරුදු දාහක් (1000) තව්තිසා දෙවියන්ගෙ ආයුෂය. පංච ශීල සම්පත්තිය ආරක්ෂා කර ගත් ඔබගෙ මිත්‍ර අමාත්‍යයෙක් සහලේ නෑයෙක් මරණින් පසු ආරක්ෂාකරාවූ ශීල සම්පත්තියෙ බලයෙන් මෙකී සුගතිගාමී ලොව ඉපදුනේ, එහි වසන දෙවියන්ට එක්වූයෙ දවස් දෙක තුනක් යනතුරු ඔබට ඔබ බලාපොරොත්තු තොරතුරු ගෙන ඒද, නොඑසේ නම් එම දෙවියන් සමග සතුටු සාමීචි වෙයිද දවස් දෙක තුනක් හෝ යම්තාක් කල් දිව්‍ය පංචකාම ගුණයන්ගෙන් සමන්විතව ඉඳුරන් හසුරුවමොද එයින් පසු අප ගොස් පායාසි රාජන්‍යයන්ට මෙසෙත් පරලොවක් ඇතැයි වෙසෙත් උපපාදුක සත්තු ඇතැයි දන්වම්හයි ඔවුන්ට මෙසේ සිතක් වන්නෙ නම් ඔහු අවුත් මෙසෙත් පරලොවක් ඇතැයි මෙසෙත් උපපාදුක සත්තු ඇතැයි මෙසෙත් කුසලා කුසල කර්මයන්ගෙ ඵල විපාක ඇතැයි දැන්විය හැකිද

**පායාසි :**

කාශ්‍යපයන් වහන්ස, මෙසේ නොවන්නේමය. ඔවුන් අප වෙතට එනවිට අප කළුරිය කර බොහෝ කල් ගතවන්නේය. එනමුත් එපමණකින් ඔබ වහන්සේගේ එම උපමාව මම පිළි නොගනිමි. එයට හේතුව තව්තිසා දිව්‍ය ලෝකයක් තිබෙන බවත් එහි මෙවන් දෙවියන් සිටින බවත්, මෙපමණ ආයුෂ තිබෙන බවත් ඔබ වහන්සේට කා විසින් දැන්වූයෙද?

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි, යම්කිසි ජාත්‍යයන්ධ පුරුෂයෙක් කලු, සුදු නොහඳුනන්නේද රතු, නිල් නොහඳුනන්නේද. රූපයන් නොහඳුනන්නේද,

සම විසම තැන් නොදකින්නේද ඉර, සඳ නොහඳුනන්නේද, එවිට එම පුද්ගලයො මෙවැනි දේ නැතයි කියයි. මම මෙය නොදනිමි. මම මෙය නොදකිමි. එනිසා එම මිනිසා මෙවන් දේ මම පිළිනොගනිමි යි කියන්නාසේ රාජානයයනි එසෙ කියන තැනැත්තා යථා තත්වය කියන්නෙ දැනගෙනද

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, එසේ කියනුයෙ මනාකොට නොම කියන්නේය. සුදු කළු රූ ඇත. සුදු කලු රූ දක්නේ ඇත. රතු, නිල් රූ ඇත. රතු නිල් රූ දක්නෙ ඇත. සම විසමතැන් ඇත. සම විසම තැන් දකින්නේ ඇත. හිරු, සඳු ඇත. හිරු සඳු දක්නේ ඇත. මම මෙය නොදනිමි. මම මෙය නොදකිමි. එම නිසා එය නැතැයි කියන්නෙ නම්, භවත් කාශ්‍යපයන් වහන්ස කියන්නෙ මනාකොට නොම කියන්නේය.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

රාජන්‍යයෙනි, නුඹ විසින් තව්තිසා වැසිදෙවියො ඇතැයි කියා හෝ මෙපමණ ආයු වළඳතැයි කියා හෝ කාශ්‍යපයන් වහන්සේට කාවිසින් කීවෙදැයි දැන්වුයේද, තව්තිසා දෙවියො ඇතැයි කියා හෝ තව්තිසා දෙවියො මෙපමණ ආයු විඳිතැයි කාශ්‍යපයන් වහන්සෙ වදාරන වචනය අප ගන්නෙ නැතැයි කියා හෝ තොප විසින් මා ජාත්‍යඅන්ධයෙකු ලෙස සිතුවෙහිද? එසෙ සිතූ බව මට වැටහේ.

රාජන්‍යයෙනි ඔබ සිතන පරිදි මෙම මසැසින් පරලොව දැක්ක නොහැක. යම් මහණ බමුණු කෙනෙක් නිහඬ නිසන්සල වනගත ආරණ්‍යවාසිව මනුෂ්‍ය වාසයෙන් ඈත්ව සෙනසුනක වාසය කරත්ද තම සිතට ක්ලේශ ධර්මයන් ඇතුලත් වීමට නොදී ප්‍රතිපත්ති විෂයෙහි මෙහෙයවූ සිතැතිව භාවනායෝගිව වැඩ වසන්නාවූ දිවැස පිරිසිදු වන්නේය. ඔහුගෙ පිරිසිදු මිනිසැස ඉක්ම පැවැති දිවැසින් මෙලොවද, පරලොවද, මැරී උපදින සත්වයෝද දකිති. රාජන්‍යයෙනි, මෙසේම පරලොව දැක්ක යුතු ඔබ සිතන පරිදි මෙම මසසින් දැක්ක නොහැක රාජන්‍යයෙනි, මෙම කරුණිනුත් ඔබට මෙසෙත් පරලොව ඇත. මෙසේම මැරී උපදින සත්වයොත් ඇත. මෙලෙසම සැප දුක් දෙන කර්ම විපාකයොත් ඇත. එය ඔබ තේරුම් ගනිත්වා.

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, මෙපමණකින් ඔබ වහන්සේ පෙන්වා දෙන කරුණු අනුව මගේ මතය වෙනස් නොවේ.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

නුඹ තවමත් එම අරමුණහෙිම එල්බ සිටින්නේ කුමන හේතුවක් නිසාද?

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, මෙහි සිල්වත්, ගුණවත්, උතුම් ගතිපැවතුම් ඇති මැරෙනු නොකැමති, සැප කැමති. දුක පිළිකුල් කරන මහණ බමුණන් දකිමි. භවත් කාශ්‍යපයන් වහන්ස මෙම සිල්වත් උතුම් ඇත්තො අපට මරණින් පසු සුගති සැප වන්නේය යි දන්නෙහි නම් මෙම මහණ බමුනෝ වස විෂයෙන් හෝ අවි ආයුධයෙන් හෝ වෙනත් උපක්‍රමයකින් මැරෙන්නාහ. යම් හෙයකින් මෙම සිල්වත් ගුණවත් බමුණෝ මෙයින් මලාවූ මරණින් මතු සුගති සැපතක් වෙතැයි නොදනිත්ද? එනිසා ජිවත් වනු කැමැත්තාහ. මැරෙනු අකමැත්තාහ. සැප කැමැත්තා දුකට අකමැතිය. තමන් නොමරන්නාහ යි මෙසේ සිතක් උපදියි. භවත් කාශ්‍යපයන් වහන්ස මෙම කරුණු කාරනා නිසා මගේ පිළිගැනීම වෙනස් නොවේ.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

රාජන්‍යයෙනි, එසේ නම් ඔබට උපමාවක් ගෙනහැර පාමි. උපමානුවෙන් බොහෝ නුවණැති පුද්ගලයින් යම් යම් දේ තේරුම් ගනිති. රාජන්‍යයෙනි පෙර වූ දෙයක් කියමි. එක්තරා බමුණෙකුට බිරියන් දෙදෙනෙක් සිටියාය. එකියකට දස අවුරුදු වයස් පුතෙකු විය. අනික් ඇත්තිට දරු ගැබක් හටගෙන දරුවකු බිහි කිරීමට ආසන්න විය. එකල්හි එම බමුණා මරණයට පත්විය. ඉන් පසු පෙර කී අනෙක් බිරිඳගෙ දරුවා පැමිණ ගැබ්බර කාන්තාවට මෙසේ කීය.

පිංවතිය මා පියාණන් මිය යාමට පෙර පියා සතු යම් ධනයක් තිබුණාද එම සියළුම ධනය හිමි මටය. එය පිළිගෙන පිංවතිගේ එයට කැමැත්ත මට දෙන්නැයි ඉල්ලා සිටියේය. එවිට ගැබ්බර කාන්තාව මෙසේ පැවසීය. මා කුස තුළ සිටින දරුවාද ඔබේ පියාගේය. එම නිසා එම දරුවාට ද මෙම ධනයෙන් කොටසක් අයිතිය. එම නිසා පිරිමි දරුවෙකු බිහිකළොත් එයින් කොටසක් ඔහුට දෙව ගැහැණු දරුවකු බිහිකළොත් ඔබ ඇය විවාහ කර ගනුවයි දන්වා සිටියේය.

එම මානවකයාගෙ මවගෙ පෙළඹවීම උඩ නැවත නැවත එම ගැබ්බර කාන්තාවට වස්තු දේපල වෙනුවෙන් තිට මෙහි කිසිත් නැත. මෙම සියළු වස්තුවට හිමිකරු මම පමණැයි කිය කියා පීඩා කරන විට එම ගැබ්බර කාන්තාව ආයුධයක් ගෙන තම යහනට වැද කුසතුළ සිටින්නේ දුවෙක්ද, පුතෙක්දැයි දැන ගැනීම සඳහා බඩ පලා ගත්තේය. ඇයද අවාසනාවන්ත ස්ත්‍රියක් වීමේ විපාක වශයෙන් තම ස්වාමි පුරුෂයා ද ඔහුගෙන් ඇයට ලැබිය යුතු ධන කොටසද, තම ජීවිතයද, ඇගෙන් ඇගේ කුසල පිළිසිඳ ගත් දරුවාගෙත් ජීවිත හානි කරගැනීමේ පාප කර්මයද, මානසික පීඩාවද වස්තුද, නැතිව මළේය.

එසේම රාජන්‍යයෙනි යම්සේ එම ස්ත්‍රිය සේම ඔබද නොමගින් පරලොව සොයන්නාහුය. රාජන්‍යයෙනි සිල්වත් ගුණවත් මහණ බමුණෝ නොමුහුකල තිබෙන ආයුෂ ආරක්ෂා කරනිමින් තමාටත්, ලෝකයාටත් සියළුම සත්ව සන්හතියටත් මෙලොව, පරලොව වැඩක්ම සිද්ද කරදී නියම ආයුෂ ගෙවමින් මිය පරලොව සුගතිගාමී වන්නේය. මෙම කරුනු කාරණාවලින් යතා තත්වය ඔබට වැටහේවායි සිතක් පහළවේවා.

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්ස, ඔබ වහන්සෙ මෙසේ පැවසුවත් මගෙ මතයෙ වෙනසක් නැත. මගෙ පිළිගැනීම එසේමයි.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

එසේ නම් රාජන්‍යයෙනි එයට හේතුව පවසනු.

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, මාගේ රාජ්‍ය පාලන ප්‍රදේශයෙ යම් සොරකමක් කරපු පුද්ගලයෙකු අල්ලාගෙන මා වෙත පමුණුවා මොහුට දිය යුතු දඬුවමක් නියම කරන්නැයි පැවසූ විට එසේ නම් රාජ පුරුෂයිනි මොහු පෙට්ටියක දමා තෙත් සමින් වෙලා, තෙත්, මැටියෙන් ඝන ලෙස මැටි ගසා පෝරණුවක තබා ගිනි අවුලවයි කීවෙමි. එම රාජ පුරුෂයෝද මා නියෝග කළ ආකාරයටම කළේය. පසුව එම පුරුෂයා මිය ගිය බව දැන ගත්තේද එම සොර සිරකර පිළිස්සූ පෙට්ටිය ඉවතට ගෙන පරීක්ෂා කර බැලීමේදී ඔහු නොමැරී සිටිනු දකින්න ඇත්නම් යහපතැයි සිතා බැලුවෙමු. ඔහු මැරී තිබුණි. ඔහුගෙන් නික්මුණ ජීවය නොදැක්කෙමු. භවත් කාශ්‍යපයන් වහන්ස යම් හේතුවකින් අපට මෙසෙත් පරලොවක් නැත. මෙසෙත් මැරී උපදින සත්වයොත් නැත. මෙසේත් සුගති, දුගති, කර්ම විපාක නැතැයි සිතක් උපදී.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එසේ නම් රාජන්‍යයෙනි මේවාටත් ඔබම පිළිතුරු දෙන්න. ඔබට වැටහෙන ආකාරයට සිතට එකඟව අසන ප්‍රශ්න විසඳන්න. රාජන්‍යයෙනි දවල් නින්දට වැටුණු ඔබට ඉතා අලංකාර වැව්. පොකුණු, උයන්. වනාන්තර වෙනත් විසිතුරු දර්ශන දකින්න ලැබේද?

පායාසි :

එසේමයි ස්වාමීනි මෙකී දෑ මම බොහෝ සේ දැක තිබේ.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එම අවස්ථාවන්හිදි කුදු ගැහැණුද, මිටි ගැහැණුද, බාල වයස් දැරියෝද, තරුණ කාන්තාවෝද ඔබට රැකවල් කෙරෙත් ද

පායාසි :

එසේය ස්වාමීනි. මෙකී කාන්තාවක් මට රැකවරණය කර තිබේ.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

එසේ නම් එම අවස්ථාවන්හිද ඔබගෙන් නික්මෙන ඇතුළුවන ජීවය දකින්ද?

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්ස ඔවුන් එය නොදකී.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි, ස්ත්‍රිහු වූ කලි තුමූ ජීවත් වන්නෝ ජීවත්වන ඔබේ ඇතුළුවන පිටවන ජීවය නොදකිත් කිමෙක් ද ඔබ කළුරිය කලාහුගේ ඇතුළුවන හෝ පිටවන හෝ ජීවය නොදකින්නා සේම මෙම කරුණු කාරණාවලින් හෝ ඔබට යථා තත්වය වැටහේවා.

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්ස, ඔබ වහන්සේ මෙසේ පවසතත් මගෙ මතයෙ වෙනසක් නැත.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි, එසේ පවසන්න හේතුවක් තිබේද? එසේ නම් එයට හේතුව පවසනු

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්ස, මාගේ බල ප්‍රදේශය වරදක් කල කෙනෙකු මාගේ රාජ පුරුෂයන් විසින් දෑත් පිටිතලබැඳ මොහු මෙනම් වරදක් කල කෙනෙකි මොහුට දිය යුතු දඬුවමක් නියම කරන්නැයි ඉල්ලා සිටි විට මා විසින් එසේ නම් රාජ පුරුෂයෙනි මොහු මරන්නට පෙර තරාදියකින් කිරා හුස්ම ගැනීමට නොහැකිවන සේ කට, නාසය තදකර බැඳ මරා නැවත තරාදියෙන් කිරා මැන බැලුහ. ඔහු ජීවත්ව සිටියදි ඔහුගේ ශරීරය සැහැල්ලුව මොලොක්කවද, ක්‍රියාකාරීත්වයෙන්ද වූහ එහෙත් ඔහු මල පසු එම ශරීරය බරෙන්ද වැඩි විය.

ක්‍රියාකාරීත්වයද නැත. දැඩි බවද වැඩි විය. භවත් කාශ්‍යපයන් වහන්ස මෙම කරුණ ද මම පරලොවක් නැත. කුසල්, අකුසල් විපාක නැත. මැරී උපදින සත්වයෙක් නැතැයි මාගේ පිළිගැනීම.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි, ඔබට තවත් උපමාවක් පෙන්වමි. යම්කිසි කම්මල් වැඩ කරුවෙකු යගුලියක් තද ගින්නේ දමා එම යගුලිය බොහෝසේ ගිනියම් වී ගිනි අඟුරක්සේ පෙනෙනවිට තරාදියකට දමා කිරා බලන විට තිබෙන බරත් වෙනසක් එය නිවී සිසිල් වූ පසු තිබෙන බරත් වෙනසත් කෙසේද?

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්ස, ගිනි සහිත එම යගුලිය වායු සහිතවද, ඇවිලෙන ගිනි සහිතවද තිබෙන අවස්ථාවේ වඩා සැහැල්ලුවටත්, මොලොක්වත් වඩා කර්මණ්‍යයද වෙයි. එම යගුලිය සිසිල් වුයෙද එවිට බර වැඩිවද, තද ගොරහැඩිද වෙයි.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

එසේම රාජන්‍යයෙනි මෙම සිරුරෙහි ප්‍රාණය තිබේද, උණුසුම තිබේද, විඥාන සහිත වේද, එවිට වඩා සැහැල්ලුවද, මොලොක් බවද, කර්මණ්‍යද වෙයි. එසේම මෙම සිරුරෙහි ප්‍රාණය ගියේද, මලේද, එවිට බර වැඩිවීමක් ද, වඩා තද ගතියක්ද වේ. මෙම කරුණු කාරනා අනුවත් ඔබට යථා තත්වය දැනේවා.

**පායාසි :**

ස්වාමීනි, ඔබ වහන්සේගේ අදහසට මම එකඟ නොවෙමි. මගෙ පිළිගැනීම එසේමයි.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

තොප එසේ සිතන්නේ කිනම් කාරුණක් නිසාද?

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, මාගේ රාජ පුරුෂයෝ වරදකරුවෙක් මා වෙත පමුණුවා මොහුට දිය යුතු දඬුවම නියම කරන්නැයි ඉල්ලා සිටිවිට. එසේ නම් මොහුගෙ ශරීරයට කිසිම හානියක් නොවන ආකාරයට උඩ අතට හාන්සි කරවා දිවි තොර කරව එසේ කරන අතර මොහුගෙන් ඉවත් වන ජීවය දැකීම මාගේ අභිප්‍රායයි කෙසේ නමුත් පිටවන ජීවයක් දක්නට නොලැබේ. තවත් අපරාධකරුවන් ශරීරයට හානි නොකර වෙනත් වෙනත් ආකාරයට දිවි තොරකර බැලුවත් මෙසේමයි. ඉන්පසු ඔවුන්ගෙ ශරීරාංග පෙරසේම තිබේ කිසිදු හානියක් නැත. එහෙත් ඒවා කිසිවක් පෙරමෙන් ක්‍රියා නොකරයි. නිසසලයි. ශරීරයට පෙරසේමයි. එහෙත් ඒ සප්‍රෂ්ට ව්‍යායතනය පහළ නොකරයි. මෙම කරුණ නිසා මාගෙ මතයෙ මෙසේම එල්බ සිටිමි.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එසේ නම් රාජන්‍යයෙනි ඔබට තවත් උපමාවක් ගෙනහැර පාමි. බොහෝ නුවණැති පුද්ගලයින් මෙම උපමාවන්ගෙන් බොහෝ දේ තේරුම් ගනිති. වටහා ගනිති. ඔබටත් එසේම වැටහේවායි සිතමි. පෙර වුවත් පවසමි එක් සක් පිඹින්නෙක් (හක් ගෙඩිය) වෙනත් දුර ප්‍රදේශයකට ගොස් තම හක් ගෙඩිය තුන් වරක් පිඹ පසෙකින් තබා ඔහු ගිමන් හරිමින් සිටින අතර එම සක් හඬ ඇසුනු බොහෝ මනුෂ්‍යයෝ එම හඬට මත්වී එම ස්ථානයට එක් රොක්වී එම තැනැත්තාගෙන් එම පියකරු ශබ්දය නිකුත්වූ සක දැක නැවතත් එම ශබ්දය ඇසීමට ඔවුන් නොයෙක් ආකාරයෙන් සකට නොයෙකුත් දේ කර බැලූ නමුත් එයින් කිසිම ශබ්දයක් පිට නොවීය.

රාජන්‍යයෙනි එවිට මෙම සක පිඹින මිනිසාට මෙහි වාසය කරන්නේ මොන තරම් මෝඩ මනුෂ්‍යයෝදැයි සිතා නැවතත් ඔහු අතට එය ගෙන තුන් වරක් පිඹ එම ස්ථානයෙන් නික්ම ගියහ. රාජන්‍යයෙනි, ඉක්බිති එම පසල් දනවු වැසියන්ට භවත්නි, යම් විටෙක මෙම සක මිනිසකු හා එක්ව පැවතියේද මිනිසාගෙ ක්‍රියාකාරීත්වය හා එක්ව පැවතියේද වායුව හා එක්ව පැවතියේද එය හඬ නගයි. එසේ එක්වීමෙන් තොම වුයේද හඬ නොනගයි. යනු සිතක් වේ. රාජ්‍යනයෙනි එපරිද්දෙන්ම යම් දිනක මෙම සිරුර ආයුෂ සහිත වේද, උණුසුම සහිතවේද, විඥාණ සහිතවේද එවිට ක්‍රියාත්මක වෙයි.

යම් දවසක එම සිරුරෙන් මෙකී දෑ ඉවත්වේද, ඉන්පසු සිරුර අක්‍රිය වේ. රාජන්‍යයනි මෙම උපමාවන්ගෙන් ඔබට යථා තත්වය වැටහේවා.

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්ස. මෙසේ වදාරතත් මෙසෙත් පරලොවක් නැත. මෙසෙත් මැරී උපදින සත්වයෝ නැත. කුසල් අකුසල්වල කර්ම ඵල විපාක නැතැයි මගේ පිළිගැනීමයි.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

එයට හේතු පෙන්වනු.

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්ස, පෙරසේම නැවතත් අපරාධකරුවකු මා වෙත ඉදිරිපත් කළ විට එසේ නම් රාජ පුරුෂයිනි මොහුගෙ සම ගලවා ජීවය සොයනු මස්, ඇට, මිදුළු ඉවත් කර ජීවය සොයනු එය කෙසේවත් දකිනු ලැබෙත්මය. භවත් කාශ්‍යපයන් වහන්ස මෙම හේතුව නිසාත් මගෙ මතයෙ වෙසක් නොවේමය.

**කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :**

රාජන්‍යයෙනි මම නැවතත් ඔබට උපමාවක් පෙන්වන්නෙමි. පෙර එක්තරා ගිනි පුදන ජටිලයන් වනාන්තරයෙහි කොළ අතු සෙවිලි කළ පැල්පතක වාසය කළේය. එකල එක්තරා දනව්වක වෙළඳුන් සමූහයක් මෙම පැල්පත තිබූ අසලින් ගමන් යන අතර වාරයේ එම ස්ථානය ආසන්නයෙ රැයක් ගත කර නික්ම ගියේය. එකල එම ජටිලයාට මෙවන් සිතක් ඇතිවිය. මෙම වෙළඳුන් සිටි ස්ථානයට ගොස් එහි මට අවශ්‍ය දෙයක් තිබුණොත් ගනිමියි සිතක් ඇතිව එම ස්ථානයට ගොස් විමසා බැලීමේදී ඉතා කුඩා පිරිමි දරුවකු සිටිනු දැක ඔහු කෙරේ ස්නේහයෙන් තම අසපුවට ගෙන ගොස් ඇති දැඩි කළේය.

මෙසේ වැඩෙන දරුවාට වයස අවුරුදු 10 - 12 ක් පමණ වන විට මෙම ජටිලයාට ගම් දනව්වක යම්කිසි උවමනාවක් නිසා එහි

යාමට සූදානම් වී දරුවා ළඟට කැඳවා දරුවා ගිනි දෙවියන් පුදව නුඹගෙ ගින්න නොනිමේවා. යම් හෙයකින් ගින්න නිවී ගියේ නම්, මේ වෑය, මේ දරය, මේ ගිනි අවුලවන අඬු දෙකය. මෙයින් ගිනි උපදවා පුදවයි අවවාද කර පිටත්ව ගියේය. අර දරුවාට මෙසේ සිතක් ඇතිවිය. මා විසින්ම ගිනි උපදවා ගිනි දල්වා ගිනි දෙවියන් පුදමි යි සිතක් ඇතිවී වෑයෙන් දඬු දෙක සැස ගිනි උපදවීමට උත්සාහ ගත් නමුත් එය අසාර්ථක විය. ඉන් පසු ගිනි නිපදවන දඬු දෙක 4 කට පැලීය. 8 ට පැලීය. උත්සාහ කළේය. ගිනි නිපදවූයේ නැත. පසුව කැබලි වලට කඩා වනෙහි දමා කෙටීය. ඉන්ද පලක් නොවීය. කිසි ආකාරයකින් ගිනි අවුලවා ගත නොහැකි විය.

ජටිල තෙම තමා ගිය කාර්යය නිම කර ආපසු අරමට පැමිණ දරුවාගෙන් ගිනි නිවුයෙදැයි ඇසීය. පියාණනි මම ක්‍රීඩා කරන අතර ගිනි නිවි නැවත අවුලවා ගැනිමට කොතෙක් උත්සාහ කළත් ඵලක් වුයේ නැත. එවිට ගිනි පුදන ජටිල තෙම අනේ මෙහෙම මෝඩ දරුවෙක් මෙහෙමත් ගිනි උපදවාගත හැකිදැයි සිතක් විය. පසුව ජටිල තෙමේ වෙනත් දඬු දෙකක් ගෙන ගිනි උපදවන ආකාරය පෙන්වා දුන්නේය. එසේම රාජන්‍යයනි අනුවන වූ නොවියත් ඔබ නොමගින් පරලොව සොයන්නාහ. රාජන්‍යයෙනි, තොපගෙ ලාමක දෘෂ්ටිය බැහැර කරන්න. එය ඔබට දික් කලත් අවැඩ පිණිස දුක් පිණිස නොවේවා.

**පායාසි :**

භවත් කාශ්‍යපයන් වහන්සෙ මෙසේ වදාරතත් මෙම ලාමක දෘෂ්ටිය බැහැර කරන්නට මට නොහැක. පායාසි රාජන්‍ය මෙසේත් පරලොව නැත මැරී උපදින සත්වයො නැත. සුකෘත දුෂ්කෘත කර්මයන්ගෙ ඵල විපාක නැතැයි පායාසි රාජන්‍ය තෙම මෙබඳු වාද ඇත්තෙකු, මෙබඳු දෘෂ්ටි ඇත්තෙකුයි පසේනදි කොසොල් රජතුමාද දනී. වෙනත් පිටත දනවි රජවරුද දනිත්. භවත් කාශ්‍යපයන් වහන්ස ඉදින් මම මෙම ලාමක වු දෘෂ්ටිය අත්හැරියෙ නම් මේ පායාසි රාජන්‍යතුමා මෝඩයෙකි. නුගතෙකි. මාහට කියන්නො බොහෝ වෙත්. එම නිසා ඔවුන් කෙරෙහි කෝපයෙනුත් මෙම දෘෂ්ටියෙ හැසිරෙමි. ඔබ වහන්ස පෙන්වා දුන් මනා කරුණු කාරනා මකන ස්වභාවයෙන් ද එම දෘෂ්ටියෙහි හැසිරෙන්නෙමි. ඔවුන්ට එකට එකක් කිරීමේ අදහසින් මෙම දෘෂ්ටිය අත් නොහරිමි.

## කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එසේ නම් රාජන්‍යයෙනි තොපට තවත් උපමාවක් ගෙනහැර දක්වමි. මෙයින්වත් තොපගෙ ලාමක දෘෂ්ටිය හැරදමා නියම මාර්ගයට පැමිණ දුගතියෙන් මිදී සුගතිගාමී මාර්ගයට පත්වන්න යි වදාළසේක. පෙරවූ සිදුවීමක් පෙර එක් දනව්වක ගැල් වෙළඳාම් කරමින් ජීවත් වන කන්ඩායමක් සිටියේය. එම කණ්ඩායමට ගැල් දහසක් තිබුණි. එම ගැල් දහස කොටස් දෙකකට බෙදා එක් කණ්ඩායමකට ගැල් 500 ගණනේ එම ගැල් 500 එක් අණදෙන නායකයෙකු යටතේ පැවතින. එයින් එක් ගැල් කණ්ඩායමක නායකත්වය දැරුවේ අප මහ බෝසතාණන් වහන්සේය. අනෙක් ගැල් කන්ඩායමේ නායකත්වය දැරුවේ දෙව්දත් තෙරණුවෝය. කන්ඩායම් දෙකම වෙනත් ජනපදයක වෙළඳාම් පිණිස යාමට සූදානම් වන අතර නායකයින් දෙදෙනා අතර මෙවන් සාකච්ඡාවක් ඇතිවිය.

එනම් අප කණ්ඩායම් දෙකේ ගැල් 1000 ක් තිබේ. එකවිට ගියොත් ගොනුන්ට ජලය. තණකොළ හිඟවන්නේය. එසේම අවසාන ගැල්වලට මාර්ගය කැඩී බිඳී වලවල් සෑදී බොහෝ අපහසු තත්වයට පත්වන්නේය. එම නිසා අප කණ්ඩායම් දෙකක් වශයෙන් එක් කණ්ඩායමක් ගොස් දින ගණනක් පසුව් අනෙක් කණ්ඩායම පිටත් වෙමු. නායකයින් දෙදෙනාම එයට එකඟ වී පළමුව යන කණ්ඩායම ගැන තීරණයක් ගැනීමට නායකයින් දෙදෙනා යෝජනා කර දෙව්දත් නායකතුමා මෙසේ සිතිය. මම පළමුව ගියොත් මග දිගට ගොනුන්ට ජලය, තණ පහසුවෙන් සපයා දිය හැකියි. මාර්ගයද අබලන් නැතිව යා හැකියි. පළමුව ගියොත් ගෙන යන භාණ්ඩ වැඩි ලාබ තියා පහසුවෙන් අලෙවිකර ගත හැකියි. මෙසේ සිතා මම පළමුවෙන් පිටත් වෙමි ඔබ පසුව එන්නැයි බෝසත් ගැල් නායකතුමාට යෝජනා කළේය. එවිට බෝසත් ගැල් නායක තුමා මෙසේ සිතිය.

මොහු පළමුව ගියොත් මොහුගේ ගොනුන් කන මෝරපු තණ දඬුවල වැඩෙන දළු පැල නොමේරූ තණ වර්ග ආහාරයට දිය හැකිය. ජලයට තිබෙන ස්ථාන පහසුවෙයි. මාර්ග අනතුරු හඳුනාගත හැකිවෙයි. මොවුන් ගෙන යන භාණ්ඩ නොව වෙනත් භාණ්ඩ ලාබ තබාගෙන අලෙවි කළ හැකියි සිතා දෙවෙනියට යෑමට කැමති විය. යෝජනා කරගත් පරිදි පළමු ගැල් කණ්ඩායම පිටත් විය. සතියක් ඉක්මගිය පසු දෙවෙනි කණ්ඩායමද පිටත් විය.

පළමු කණ්ඩායම මෙසේ දින තුනක් පමණ ගිය පසු අමනුෂ්‍ය උපද්‍රව ඇති එක් කාන්තාරයක් හරහා ගමනාරම්භ කරමින් සිටියදී ඉදිරියෙන් රථයක නැගී තෙත් ඇඳුම් ඇඳගත් මානෙල් මල් මිටියක් අතින් ගත් මඩ තැවරුනු රොද සහිතව රථයකින් එක් පුද්ගලයෙකු සිනහවක් පාමින් ඉදිරියට පැමිණ රථය නැවැත්වීය. එවිට ගැල් නායක තෙමේ මොහුගෙන් ඉදිරි මාර්ගයේ තොරතුරු විමසුවේය. එවිට රථයේ සිටි මිනිසා තව ටික දුරක් ගියතැන වර්ෂාව පවතින බවත් මාර්ගය හරහා ජලය ගලා බසින බවත් පවසා මෙම ගොනුන් වෙහෙසට පත් කරවන්න මෙම වියළි තණත් කැකෑරූ ජලයත් කෑමට ගෙන යනවාද ඉදිරියේදී මේවා ඕනෑ තරම් තිබෙන බව පවසා එම මිනිසා නික්ම ගියේය. අදූරදර්ශී මෝඩ ගැල් නායක එම උපක්‍රමයට රැවටී තම පිරිසට ගැල්වල තිබෙන ජලයත්, තණකොළත් ඉවතට දමා වේගයෙන් ගොනුන් ලවා ගැල් ඉදිරියට ගෙන යන ලෙසත් උපදෙස් දුන්නේය. ඒ අනුව ගැල්වල තිබූ ජලයත්. තණත් ඉවත් කර වේගයෙන් ඉදිරියට ගියමුත් මිරිගුවෙන් පිරි කාන්තාරය හැර කිසිම පැළෑටියක් හෝ දිය බිඳක් නොමැති ඉතා අපහසුවෙන් තවත් ඉදිරියට යාමේදී පළමුව මනුෂ්‍ය වේගයෙන් පැමිණි අමනුෂ්‍යයා ඇතුළු ඔහුගෙ පිරිස පැමිණ ගැල්කරුවන්ගේ සහ ගොනුන්ගේ ඇටකටු පමණක් ඉතිරිකර ඔවුන් මරා කා ගියේය.

දෙවෙනිව එන අප මහා බෝසතාණන් වහන්සේ සහ පිරිවර මඟ සලකුණු බලමින් පළමු ගිය කණ්ඩායම ගමන් කළ මාර්ගය ඔස්සේ ඉදිරියට යන අතර පළමු කී අමනුෂ්‍ය උපද්‍රව ඇති පෙදෙස හරහා යාමට වත් කල්හි පෙර කී ආකාරයටම එම අමනුෂ්‍ය නායකයා පෙර කී විලාශයෙන්ම පැමිණ පෙර කී විස්තරයම පවසා සිටියේය. අප මහ බෝසතාණන් වහන්සේ මොහු දුටු සැනින් අමනුෂ්‍යකු බව වටහාගෙන තම පිරිසට ඒ බැව් මෙසේ දන්වා සිටියේය. අමනුෂ්‍යයින්ගෙ සෙවනැල්ලක් නැති බවත්, ඇස් පිය ගැසීමක් නැති බවත් දන්වා සිටියේය. ඉදිරියෙ අමනුෂ්‍ය උපද්‍රව ඇතිවිය හැකි බැවින් තිබෙන ආහාර, ජලය, ගොනුන් සඳහා තිබෙන තණ ආදිය අරපිරිමැස්මෙන් පරිහරණය කරන ලෙසත් කිසිම දෙයකට බියක් ඇතිකර නොගන්නා ලෙසත් අවවාද කර කලින් ගිය ගැල් මාර්ගයම ඉදිරියට යන අතර ඉතා භියකරු දර්ශණයක් වූ පළමු ගැල් 500 ත් ගොනුන්ගෙ සහ මිනිසුන්ගෙ ඇටකටුත් ගැල්වල තිබූ භාණ්ඩ සෑම තැනම විසිරී තිබෙනුත් දැක මහත් සංවේගයට පැමිණ ගැල් නායක තුමා වටා එක්රොක් වී

උපදෙස් පැතිය. (මෙම පිරිස ද සම්මා සම්බුද්ධ රාජ්‍යයට පත්වූ අවස්ථාවේ සිටි පිරිසමය.) උපදෙස් පරිදි විනාශවූ ගැල් වල තිබූ වටිනා භාණ්ඩ තම ගැල්වලට පටවා එම ගැල්වල තිබූ අඩු වටිනා භාණ්ඩ එහි දමා නිරුපද්‍රිතව තම කාර්ය කරගෙන තම අඹු දරුවන් කරා පැමිණියහ.

එසේම රාජන්‍යයෙනි ඔබත් එම මෝඩ ගැල් නායකයා වාගේ සිහිමුලාවී පරලොව සොයා විනාශයට නොයා අඥාණ මතයෙන් වෙන්වී පරලොව සුගතියක් කර ගත්හ.

## පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස ඔබ වහන්සේ කොතෙක් මාහට කරුණු සැලකළත් මෙම දෘෂ්ටිය අත්හැරීමට නොහැකි මාගේ මෙම දෘෂ්ටිය අත්හැරීම මට මදි පුංචි කමක් ලෙස සලකමි. ඒ මන්ද මෙම දෘෂ්ටියෙ මම එල්බ සිටින බව මෙම රාජ්‍යයෙ පමණක් නොව අසල් රාජ්‍යයන්හිද පැතිරී තිබේ. එම අය සමග එකට එක කිරීමක් වශයෙන් මෙම දෘෂ්ටිය අත් නොහරිමි.

## කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එසේ නම් රාජන්‍යයෙනි ඔබට තව තවත් උපමාවක් පෙන්වා දෙමි. හොඳින් අසව. රජන්‍යයෙන් එක්තරා ගමක ඌරන් ඇති කරන මිනිසෙක් තම අවශ්‍යතාවයක් සඳහා වෙනත් ගම්මානයකට ගියේය. තම ගිය කාර්ය කර ආපසු ඒමේදි එක් පාලු පෙදෙසක මිනිසුන් විසින් මලපහරන ලද අසුචි ගොඩවල් අමුවෙනුත්, පරන ඒවා වියලීත් තිබෙනු දැක මේවා මාගේ ඌරන්ට දෙන්න ගෙන යායුතුයයි සිතා තම සළුපට බිම එලා වියළි අසුචි පමණක් සළුපටට එකතු කර පොදියක් බැඳ හිසමත තබා ඌරන්ට හොඳ කෑමක් යයි සතුටු සිතින් රැගෙන යන අතරමගදි බලාපොරොත්තු නොවූ වැස්සක් වැස එම මිනිසාත් හිස මත තිබූ පොදියත් තෙමී පෙඟි පෙඟි ඇඟ මත වැගිරෙන්නට පටන් ගති. ඌරන්ට තවත් පහසුවෙන් කෑමට හැකියි සිතා තෙමි තෙමීම පොදිය රැ ගෙන යන අතර මග දිගට මිනිසුන් ඔහුට නින්දා අපහාස කළහ. තොපි කුමක් කියන්නෙහිද මෙය මාගේ ඌරන්ට දෙන ආහාරයක් යයි කීහ. රාජන්‍යයෙහි තොපත් එම අසුචි ගෙන ගිය මිනිසාත් එකවාගෙ මෝඩයෝයි. දැන්වත් වැරදි මතයෙන් ඉවත් වෙනුයි පැවසීය.

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, මෙතනදිත් මට මෙම දෘෂ්ටියෙන් ඉවත්වීමට නොහැකි පසෙනදි කොසොල් රජතුමාද, අවට රාජ්‍ය නායක යොද එම දනව් වැසියොද මාගෙ තර්කය පරලොවක් නැත. මැරී උපදින සත්වයො නැත. කුසලා කුසලවලට විල විපාක නැත කියා මෙතෙක් ගත් දෘෂ්ටිය අත්හැරියෙ නම් ඔවුන්ගෙන් එන නින්දා අපහාස වලින් මිදිමටයි.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

රාජන්‍යයෙනි, ඔබට තවත් උපමාවක් කරන්නෙමි බොහෝ නුවණැති පුද්ගලයෝ උපමාවන්ගෙන් තම බුද්ධිමහිමය වර්ධනය කර තේරුම් ගනිති. ඔබටත් එසේම වේවා.

රාජන්‍යයෙනි පෙර සිදුවීමක් කියමි.

සූදු ක්‍රීඩා කරන්නන් දෙදෙනෙක් පසැටින් දූ කෙලියහ. එක් දූවරුවෙක් ආ ආ (පරදින පරදින) පසැට ගිලී දෙවෙනි දුවරුතෙම එම දූවරුවා පැරදුනු පැරදිනු පසැට ගිලුනු දිටීය. දැක එම දූවරුවාට යහලුව, තෝ ඒකාන්තයෙන් දිනන්නෙහිය. යහලුව මට සියලු පස ඇට දෙවා බිලියමක් කරන්නෙමියි කීය. යහළුවා එසේයැයි කියා එම දූවරුහට සියලු පසැට දුන්නේය. එකල ඒ දුවරුතෙම පසැට විසයෙන් යොදා ඒ අනිත් දුවරුවා බනවා යහලු එව පසැටින් කෙලින්නමොයි කීහ. හේ එසෙය යහලුයි කියාම ඔහුට පිළිවදන් දුන දෙවනුවද ඒ දූවරුවෝ පසැටින් කෙලියාහ. දෙවනුද ඒ දුවාරුවා පස ඇට ගිලින්නහු දිටීය දැක ඒ දූවරුවාට,

තියුණු විසයෙන් තවරන ලද පසැට ගිලින පුරිස් එය (විස තවරා ඇති බව) නොදනී බොල පව්ටු දුහුම ගිල පිය පසුව එය තට නපුරකි.

රාජන්‍යයෙනි, මෙසේම ඔබ පසැට දුහුවකු මෙන් පෙනෙති. රාජන්‍යයෙනි, මේ ලාමක දෘෂ්ටිය බැහැර කරන්න. එය ඔබට දිගු කලක් අවැඩ පිණිස දුක් පිණිස නොවේවා.

පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, මෙසේ වදාරතත් මෙම ලාමක දෘෂ්ටිය හැරීමට මට නොහැකිය. එසේ මෙම දෘෂ්ටිය හැරියොත් මාහට ගරහන අය බොහෝ වෙත්.

කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

එසේ නම් ඔබට තවත් උපමාවක් කරන්නෙමි. රාජන්‍යයෙනි පෙර සිදුවූවක් කියමි. එක්තරා දනව්වක වැසියෝ එම දනව්ව හැරදමා ගියේය. එය දැනගත් එක් මිනිසෙකු තවත් මිනිසකු අමතා මෙසේ කීය. යහළුව අප දෙදෙනා මිනිසුන් අතහැර ගිය ගමට ගොස් එහි තිබෙන දෙයක් ගෙන එමුයි කථා කරගති. ඒ අනුව දෙදෙනාම පාලු ගමට ගොස් පරීක්ෂා කිරීමේදි ගෝනි නිපදවන හන ගොඩක් දැක දෙදෙනාම තමාට ගෙන යා හැකි ප්‍රමාණයට හන මිටි දෙකක් බැඳ හිස මත තබාගෙන යන අතර මද දුරක් යාමේදි මිනිසුන් විසින් අතහැර දමන ලද හන නූල් ගොඩක් දැක යහළුව අප ගෙන යන මෙම හන අතහැර දමා එයට වඩා වටිනා මෙම නූල් ගෙන යා හැකි පමණ ගෙන ගොස් විකුණා මුදල් ලබමුයි යෝජනා කළවිට අනෙක් යහළුවා පැවසුවේ මෙපමණ දුරක් මහන්සියෙන් ගෙන ආ මෙම හන මිටිය දමා යා නොහැකි බවත්ය. අනෙකා තමා ගෙන ආ හන මිටිය දමා, ගෙනයාහැකි පමණට හන නූල් බැඳගෙන ගියේය. මෙසේ යන අතර තවත් එවැනිම ස්ථානයක බොහෝ සේ හන රෙදි තිබෙනු දැක හන නූල් ගත් තැනැත්තා මෙසේ කීහ. යහළුව අප ආවේ කියක් හරි උපයාගන්නට එසේ නම් එම මෙම හන නූල්වලට වඩා මිල වැඩි හන රෙදි මිටියත් බැඳගෙන මෙම හන නූල් මිටිය දමා යන්නෙමි. තොපත් ඔය හන මිටිය ඉවත දමා මෙයින් හන රෙදි මිටියක් බැඳ ගනුව. ඒවාට වැඩි මුදලක් ගතහැකියි කීවේය. හන මිටිය ගත් තැනැත්තා මෙපමණ මහන්සියෙන් මෙපමණ දුක් මම මෙම හන මිටිය ගෙනාවේ මග දමා යන්න නොවෙයි ඔබ ඔබගෙ කැමැත්තක් කරන්නැයි කීවේය.

මේ ආකාරයෙන් දෙදෙනාගෙන් එක් අයෙක් මුලින් ගත් හන මිටියත් අනෙක් මිත්‍රයා මග දිගට ලැබෙන වඩා වටිනා දේ රැගෙන හිස මත තිබෙන අඩු වටිනා දේ එහි දමා යමින් අවසානයේ රිදී බර දමා රත්රන් බරක් ගෙන තම නිවසට ගියේය. එහි සිටි නෑ හිත

මිතුරන් සැවොම එක්වී බොහෝසේ සතුටට පත්ව මහත් ගෞරවයෙන් ඔහු පිළිගත්තේය. සැපසේ විසීය.

මුලින් හිස මතට හන මිටිය ගත් තැනැත්තා ගෙදර සිටි සැවොමගෙ පිළිකුලටත් නින්දා අපහාසයටත් ගැරහීම්වලටත් ලක්වී පශ්චත්තාප වූ ආකාරයට තොපත් රාජන්‍යයෙහි පත්ව තිබෙන නිසා දැන්වත් තොපගෙ හිසමත තිබෙන හන මිටිය වන් ලාමක දෘෂ්ටිය ඉවත දමා යථා තත්වය තේරුම්ගෙන ඔබට අතිදීර්ඝ කාලයක් දුක් දෙන අවැඩ වෙන මෙම දෘෂ්ටියෙන් මිදෙන්න.

### පායාසි :

භවත් කාශ්‍යපයන් වහන්ස, පළමු උපමාවෙන්ම ඔබ වහන්සේ කෙරෙහි සැපදුවෙමි. එනමුත් මෙතරම් විසිතුරු පැණ අසා දැන ගැනීමට කැමැත්ත නිසා එයට පිටුපා අදහස් ඉදිරිපත් කළෙමි. භවත් කාශ්‍යපයන් වහන්ස ඔබ වහන්සේගේ උපමා කතා ඉතා විශිෂ්ටයි. ඉතා පැහැදිලියි. නොයෙක් උපමාවන්ගෙන් දහම් දෙසීම මාගේ සිතට මනස්කාන්තවිය. යටිකුරු දෙයක් උඩුකුරු කර පෙන්වා දීමක් බඳුය. අතරමං වුවෙකුට නියම මාර්ගය පෙන්වාදීමක් බඳුය. ඔබ වහන්සේගේ මෙම ධර්ම දේශනාව බොහෝ සත්වයින්ට දෙලොව අභිවෘද්ධිය සඳහා වන්නේය. අන්ධකාරයට දැල්වූ පහණක් වැනිය.

අද මේවෙලේ මෙවක් පටන් මම බුදුරජාණන් වහන්සේ සරණ යමි. ධර්මය සරණ යමි. මහා සංඝ රත්නය සරණ යමි. භවත් කාශ්‍යපයන් වහන්ස මෙවක් පටන් මා දිවි හිමියෙන්. ඔබ වහන්සේගේ උවසුවෙකු ලෙස සලකත්වා !!! කාශ්‍යපයන් වහන්ස මා කෙරෙහි අනුකම්පාවෙන් මාගෙ පරලොව අභිවෘද්ධිය උදෙසාත් දිකු කලක් සැප පිණිසත් ඔබ වහන්සෙ ප්‍රධාන මෙම සංඝරත්නය උදෙසා මහා දනක් දිම සඳහා මා කෙරේ අනුකම්පාවෙන් හෙට දිනය ඉවසා වදාරනවා සේක්වායි ඉල්ලා සිටියේය.

### කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ :

රාජන්‍යයෙනි, යම් කිසිවෙක් දානයක් පිරිනැමීමේදි එම දානය සඳහා යාතුන් මරා හෝ දානය වෙනුවෙන් මැරීමට අනුබලදී හෝ වෙනත් ආකාරයකින්

එම දානය නිසා සතුන් මැරීමට සිදුවී හෝ එම දානය පිළිගන්නොත් මිථ්‍යා දෘෂ්ටි ඇත්තො මිත්‍යා සංකල්ප ඇත්තෝ වචන ඇත්තො මිථ්‍යා කර්මාන්ත ඇත්තො මිථ්‍යා ආජීවය ඇත්තෝද, රජනුයයනි,

මෙවන් දානය මහත් ඵල මහානිසංස නොවෙත්. මහත් අනුසස් ඇත්තො නොවෙත්. රාජන්‍යයෙනි යම්කිසි දානයක් පිරිනැමීමේදි ඉහතින් සඳහන් කරුනු කාරාණාවලින් වැළකි ශ්‍රද්ධාවෙන් භක්තියෙන් ගරුත්වයෙන් පිරිනමන දානය මහත්පල මහානිසංස වෙත්. මහත් අනුසස් ඇත්තෙ වෙයි. මහත් බැබලීම් ඇත්තෙවෙයි. රාජන්‍යයෙනි එය ගොවියෙක් ක්‍රමානුකූලව ගොවිතැන් කර අවශ්‍ය වෙලාවට වතුර, පොහොර, බිජ, ගොවි බිමේ ආරක්ෂාව කලොත් එයින් හොඳ අස්වැන්නක් ලබා ගන්නාමෙනි.

ඉන්පසු පායාසී රාජන්‍ය තෙම මහන බමුණන්ට දුගියන්ට. මගියන්ට, යදියන්ට දන් පිහිට වූහ. එම දානය වනාහි කාඩි දෙවනු කොට ඇති නිවුඩු සහලින් පිසු බත් ඇති බොජුනක් දෙයි. මහත් දාවලු ඇති දල පිළිදෙවෙයි. එම දානය වූ කලි උත්තර නම් මානවකයෙක් විය. ඔහු දන්දි මේ දානය කනකොට මම් පායාසි රාජන්‍යයා හා මෙලොවෙහිදි එක්වීම් පරලොව එක්වීමක් නොවේයයි හේ පුන පුනා කියයි.

පායාසිට එපවත් ඇසීමට ලැබී එම උත්තර මානවකයා කැඳවා, දරුව තොප දන්දි මෙවන් පැතුමක් කරනවාය කියන්නේ සැබෑදැයි විමසීය. එවිට උත්තර මානවක එය සැබෑයයි පැවසීය. අපි බොහෝ පිනට කැමැත්ත වෙමු. තොප මෙවන් ප්‍රාර්ථනාවක් කිරීමට හේතුව කුමක්ද? භවත්හුගෙ දානය කාඩි දෙවනු කොට ඇති නිවුඩු සහලින් පිසු බත් ඇති බොජුනක් වෙයි. භවත්හු එය පයිනුදු පහස්නට නොකැමැත්තෙමු. වළඳන්නට කෙසෙ කැමතිවෙත්ද? භවත් තෙමේ යම් වස්ත්‍රයක් හඳින්නට තබා පය පිසදන්නට ද කැමති නොවෙමු.

ඔබතුමා අපට ප්‍රියය. මනාපයය. අපි කෙසේ නම් මනාපුයෙක්හු. අමනාපයක්හු එක්කොටයොද, මෝදයි උත්තර මානවක පැවසීය. එවිට රාජන්‍ය මෙසේ පැවසීය. එසේ නම් දරුව මම යම් බොජුනක් වළඳයිද එම බොජුනම දන්දිම සඳහා තවම මම යම් සළු පිළියම් හැදිද එවන් වස්ත්‍ර දන්දිම සඳහා තබව. උත්තර මානවකද, බොහෝ සේ සතුටට පත්ව කියන ලද ආකාරයෙන්ම එතැන් පටන් දන් දුන්නේය.

ඉක්බිත්තෙන් පායාසි රාජන්‍ය තෙම නොසලකා දන්දීමෙන්ද සියතින් දන් නොදීමෙන් ද ගෞරව නැතිව දන් දීමෙන්ද. තමාට අනවශ්‍ය ඉවත දමන දෙයක් දීමෙන්ද, මරණින් පසු සිව් මහා රජයෙ දෙවියන් හා එක්විමට. සේරිසක නම් හිස්වු විමනක උපත ලදහ. උත්තර නම් මානවකයා විසින් ඔහුගෙ දානයෙහි ව්‍යාපෘතවීද හේ සකසා දන්දී ගෞරව ඇතිව දන්දී, ගරුසරු ඇතිව දන්දී මරණින් පසු තව්තිසා දෙවියන් හා ඇසුරට පත්විය.

එසමයෙහි වනාහි ආයුෂ්මත් ගවම්පති මහ තෙරණුවෝ හිස්වූ සේරිස්සක නම් විමනට දිවා විවරණය පිණිස එහි වඩිති. එකල පායාසි දෙව්පුත් මහ තෙරුන් වෙත එළඹ වැඳ එකත් පසක සිටියාය. එවිට මහ තෙරුන් වහන්සේ ඇවැත්නි නුඹ කව්රුන්දැයි විමසීය. ස්වාමිනි මම පායාසි රාජන්‍ය වෙමි. යි කීය. ඇවැත්නි තොප පරලොවක් නැතැයි මැරී උපදින සත්වයෝ නැතැයි කර්ම විපාක ඵල නැතැයි යන මතයෙ එල්බ සිටියානේදැයි විමසීය. ස්වාමිනි මම එම ලාමක දෘෂ්ටියෙ එල්බ සිටියදී කුමාර කාශ්‍යප හිමියන් විසින් එම ලාමක දෘෂ්ටියෙන් මිදවුවෙමි.

"ඇවැත්නි, යම් උත්තර නම් මානවකයෙක් ඔබගෙ දාන ක්‍රියාවෙහි ව්‍යාපෘත වුයේද ඔහු උපන් තැන දන්නේදැයි විමසීය. පිංවත් ස්වාමින් වහන්ස එම උත්තර නම් මානවකයා මගේ දානයෙහි ව්‍යාපෘතවීද ඔහු බොහෝසේ සැදැහැ සිතින් ගෞරවයෙන් සිය අතින්ම දන්දී ඉවත දමන දෙය නොව හොඳ දෙයක්ම දන්දී එම කුසල බලයෙන් තව්තිසා දිව්‍යලොව ඒසා සැප සම්පත් ඇති එහි දෙවියන්ට ප්‍රිය වූ නිතරම දෙවියන් අතර සතුටු සිතින් කල් ගෙවන්නාහ.

මා විසින් කිසි ගරුත්වයක් නොමැතිව අනුන් ලවා මට අනවශ්‍ය දෙය ඉවත දමනදේ කිසි ගරුසරුවක් නොමැතිව දන්දී එහි කර්ම විපාක වශයෙන් සතර අපා දුකකට පත්නොවී මෙම පාළුවු හිස්වු සේරිස්ක, විමානයො හුදකලාවම කාලය ගෙවමි. ඉන්පසු එම "ගවම්පති" ස්ථවිර පාදයන් වහන්සෙ මනුලොවට වැඩමකර මෙම සියලු විස්තර මහ ජනයාට ධර්මදේශනා මාර්ගයෙන් පෙන්වා වදාළ සේක. පිංවත්, නුවණැති සත්වයො එය තේරුම්ගෙන දානමාන කළයුතු ආකාරයත් ශිල සම්පත්තිය දියුණු කරගෙන සසර දුකෙන් මිදිමටත් දාන, ශීල, භාවනා වඩා සුගතිගාමී වීමටත් ක්‍රියා කළහ.

පිංවත්නි,

එක්තරා ධෛර්යමත් උට්ඨාන වීර්යයෙන්ද කාලය අපතේ නොහරිමින්ද, ආදර්ශමත්වද සමාජයට හිතකරවද ජීවත්වන පුරුෂයෙක් දිනක් ගමනක් යන අතර මගදී කොස් ගසක බොහෝසේ ගෙඩි තිබෙනු දැකමෙසේ සිතක් උපදින.

මා විසින් මෙම ගසට නැග පැසුන කොස් ගෙඩියක් කඩාගෙන ගොස් එය මනාලෙස සකසා පොල් ගසකටත් නැග පැසුන පොල් ගෙඩි දෙක තුනක් කඩා එම ආකාරයෙන් පොල් ගා දියයුතුයි සිතා ගසට නැග කොස් ගෙඩියක් කඩා කටු වහල්ල, ඉරි, කොහොල්ලෑ ඉවත් කර මදුළු වෙන්කර එවා පලා ඇට. සිඹිඩිත් අයින් කර මදුලු 1ක් තුනට කපා නිවසකටදී මේවා කැමති ආකාරයට කැම සඳහා සූදානම් කරන්නැයි කියා හිරමනෙන් ගාන ලද පොලුත් සමග දෙන්නේය.

ඉන්පසු එම ගෙහිමියො තම කාලයත් ධනයත්, ඉතිරිකර ගනිමින් නිතර නොලැබෙන ශරීරයට හිතකර, රසායනිකයෙන් තොර ඕනෑම ආකාරයට සකසා ගත හැකි වටිනා ආහාරයක් බව තේරුම් ගෙන කොස් ඇට ටිකකුත් සුද්දකර දෙකට, තුනට කපා තම්බා පොල් සමග කා වේල පිරිමසා ගත්තේය. තව ටිකක් උත්සාහ කලොත් පොල් ටික මිරිකා කිරිගෙන හොද්දක් සාදා ඒ සමග අනුභව කරන්නේය. ධනය යහමින් තිබෙන හෝ සාමාන්‍ය හෝ මෙයින් උපරිම ප්‍රයෝජන ගනිමුයි සාකච්ඡා කරගෙන ලූණු, මිරිස්, කුරුඳු පොතු, රම්පෙ, කරපිංචා දමා කිරිකොස් ව්‍යංජනයක් සාදාගෙන මෙලොවටත් බය නෑ පරලොවටත් බය නෑ කියා අනුභව කර සතුටුවන්නේය. එය දැන ගන්නා වෙහෙස මහන්සි වී ගස් දෙකකට නැග කොස් හා පොල් කඩා ප්‍රයෝජනයට ගැනීමට පහසු කරදුන් උතුම් මිතුරා සතුටු වන්නේය.

පිංවත්නි,

මෙහි තේරුම මෙසේයි.

බුදුරජාණන් වහන්සෙ විසින් පුරා අවුරුදු 45 ක් දේශනා කරන ලද ධර්මයද විශාල ගසක තිබෙන එලදාවක් වැනිය. එක් එක් ස්ථානයන්හිදී එක් එක් හේතුන් උඩ දේශනා කර හැර වර්තමානයේ මෙන් ග්‍රන්ථාරූඪ කිරීමක් නොවීය. එය අසා දැනගත් පිරිස අතර

පමණක් තිබිණ. අසා දැනගත් පිරිස ද ක්‍රමානුකූලව ක්ෂය වන්නේය. මේ බැව් තේරුම් ගත් කාශ්‍යප මහ රහතන් වහන්සේ, ධර්ම භාණ්ඩාගාරික ආනන්ද මහ තෙරුන් වහන්සේගේ සහය ලබා මෙකී දෙනම ඇතුළු 500ක් මහ රහතන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් බුදුරජාණන් වහන්සේ වදාල සූත්‍ර විනය, අභිධර්මය, ජාතක කථා සියල්ලම බුදුරජාණන් වහන්සේ පිරිනිවී තුන් මසක් ගියතැන අජාසත්ත මහ රජතුමාගෙ රාජ අනුග්‍රහය ඇතුව වේභාර පර්වත පාමුල සප්තපර්ණී ගුහාව ඉදිරිපිට මාස 5 ක් ඇතුළත සිදුකර එක් එක් කණ්ඩායම් වශයෙන් බෙදා (කොස් ගෙඩිය ඉදී කුනුවී යා නොදෙන ආකාරයට) ශ්‍රී සද්ධර්මය උගන්වා පාඩම් කරදී ආරක්ෂා කරගෙන පැමිණියේය. (පැසුනු කොස් ගෙඩිය ගසෙන් බිමට බැම) එම ධර්ම සංගායනාවෙන් ආරක්ෂා කරගෙන ආ ධර්මයට අවුරුදු සීයක් ගිය පසු (කොස් ගෙඩියෙ කටු, කොහොල්ලෑ. ඉරි, වහල්ල වැනි දෑ මෙන් වජ්ජි පුත්ත භික්ෂූන් විසින් සම්මත කරගත් දසඇකැප වස්තු) ඉවත් කිරීමක් වන් බිමට බා ගත් කොස් ගෙඩිය ඉදෙන්නට නොදී දස අකැපවස්තු මෙන් ඇට මදුලු වෙන් කරපු ආකාරයට මෙම ශ්‍රී සද්ධර්මය තවත් අවුරු 235 ක් ආරක්ෂා කරගෙන පැමිණි සේක.

එම දෙවන ධර්ම සංඝායනාව යස තෙරුන් වහන්සේ ප්‍රධාන 700 ක් මහ රහතන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් කාල අශෝක, මහරජතුමාගේ රාජ්‍ය අනුග්‍රහය ඇතුව විශාලා මහනුවර බුදුරජාණන් වහන්සේ වැඩසිටි වාලුකාරාම විහාරයේදී මාස 7ක් තුළ සිදු කරන ලදි.

මෙසේ අවුරුදු 235 ක් ගිය තැන බුදු සසුනේ බැබලීමට අවුරුදු 2550 ක් යනතුරු එම ධර්මය ආරක්ෂා කරදීමට එම වගකීම මා වෙත පැවරෙන බවත් මාගෙන් එය ඉෂ්ට වන බවත් බුදුරජාණන් වහන්සේ ප්‍රධාන අසූමහා ශ්‍රාවකයන් වහන්සේලාම දිවසින් දැක දැන ගත් කටයුත්ත මා විසින් අකුරටම ඉටු කරමියි සිතා (එම නිසි අවස්ථාව පැමිණෙන තෙක් ඉවසීමෙන් සිට නියම අවස්ථාවට පැමිණි වහාම ධර්මාශෝක මහා අධිරාජ්‍යාගෙ රාජ්‍ය අනුග්‍රහය ඇතුව ශාසනයට ඇතුළත්ව සිටි 60000 ක් අන්‍යතිර්තකයින් පලවා හැර නැවතත් බුදු සසුනේ ප්‍රබෝධයක් සහ තම පුතු සහ දුව වන මිහිඳු මහ රහතන් වහන්සේද සංඝමිත්තා තෙරණින් වහන්සේ නිසා ලක්දිව බුදු සසුන ඇතිවී වර්තමානයේ එය නැතිවී යාමට කරුනු කාරණා ඇතිවුවත් ලෝක පාලක දෙවියන් සහ ශාසනය ආරක්ෂා කරන දෙවියන් අවස්ථාව එනතෙක් ඉවසීමෙන් සිටිති.

පිංවතුනි,

අද වන විට තුන්වන ධර්ම සංඝායනාවෙන් ඉවත් කරන ලද 60000 ක් අන්‍ය තිර්තකයින්, දෙවන ධර්ම සංඝායනාවට හේතු කාරක වූ වජ්ජි පුත්‍ර භික්සූන් ද පළමුවන ධර්ම සංඝායනාවට හේතු කාරක වූ සුභද්‍ර නම් භික්ෂු පරපුරද ඇතුළත්වී තව ඉදිරියට අවුරුදු 2500 ක් නොව අවුරුදු 200 ක් වත් ගෙනයාමට නොහැකි තත්වයක් පවතින බව මතක් කර දිය යුතු නැත. තම තමා නැණ පමණින් දැන ගත යුතු වර්තමානයේ සිල්වත්, ගුණවත්, ධර්ම විනයට අනුව ජිවත් වන භික්ෂුන් වහන්සේලා පත්වී තිබෙන තත්වය බුදුරජාණන් වහන්සේ විසින්ම පසේනදි කොසොල් මහ රජතුමාගෙ 11 වන සිහිනය වූ කහවනු ලක්ෂයක් වටිනා සඳුන් අරටුවක් කුණු මොරු සැලියකට හුවමාරු කර ගැනීමේ සිද්ධියට අදාල සිහිනයෙදි මෙසේ වදාරා තිබේ.

මහරජ මෙම බුද්ධ ශාසනයෙහි අනාගත දුසිල්වත් භික්ෂුන් ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙන්ම ආගමික කටයුතු කරති. ධර්ම දේශනා කරන්නේද නොයෙකුත් දේ බලාපොරොත්තුවෙන්මය. එසේම පැවිද්දෝ ශාසනයට අපහාස වන අයුරින් කටයුතු කරති. සිල්වත් පැවිද්දන්ට අවස්ථාවක් නොලැබෙති. පාලකයින්, නිලධාරින්, ව්‍යාපාරිකයින්, දුසිල් පැවිද්දන් ප්‍රිය කරති. ධර්ම විනය අතහැර දමා පැවිද්දෝ වෙනත් විනය විරෝධි කටයුතු වල යෙදෙති. මිනිසුන්ගේ තෘෂ්ණාව වැඩි වන පිණිසම ධර්ම දේශනා කරති. තම පුද්ගලික උවමනාවන් ඉටුකර ගැනීම උදෙසාම මිනිසුන් පොළඹවති.

ඉහත සඳහන් කරුනු කාරනා මම කියන දෙයක් නොව බුදුරජාණන් වහන්සේම පෙන්වා වදාළ සේක. මා විසින් කියන කාරන වරහන් ඇතුලේ ඇත.

මා විසින් සම්පාදනය කරනු ලබන්නේ ධර්ම දානය සඳහා පමණක් නිසා තව තවත් විස්තර වෙනත් ග්‍රන්ථයකට තබා මෙතැනින් නවතිමි. සැම සියළු සත්වයින්ටම ධර්ම ඥානය පහළවේවායි එක සිතින් පතමි.

මීට,

මෙතැති,

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

ශ්‍රී ගුණවර්ධ යෝගාශ්‍රමය
ගල්දූව - කහව.

මුද්‍රණය :

සක්වා ප්‍රින්ටර්ස්
SAKVA PRINTERS
අංක 51/A, කුලරත්න පාර, අම්බලන්ගොඩ.
Tel / Fax : 091-2258756